**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.1 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇති බව මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාලක ජනරාල්වරයාට ඉදිරිපත් කළ වාර්තාවට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14ක හඳුනාගත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 24ක් ලෙස ඇස්තමේන්තු කර එය රු. මිලියන 559ක් ලෙස මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අගය කර ඇති අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ (ACA-P) හෙළිදරව් කර ඇත. කෙසේ වෙතත් 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03කට අදාළව රුපියල් මිලියන 23ක වටිනාකමකින් යුත් එම ඉඩම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක අයිතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කර ඇත. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ පිළිවෙළින් රු.2,499,806ක් සහ රු.1,997,500ක් ලෙස ශේෂ පිරික්ෂුමේ හෙළිදරව් කර තිබුණි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර මුද්‍රණ පත්‍රයේ SA-82 හි ඉහත මුදල් රු.4,197,306 ලෙස පෙන්වා දී ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ද (ACA-P) එම වටිනාකමම පිළිබිඹු වේ. එම නිසා රු.300,000 ක වෙනසක් දක්නට ලැබුණි. | මෙම වැරැද්ද සිදුවී ඇති අතර, අනාගතයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

**තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රඳවා ගත් තැන්පතුව රු.26,355,774 ක් වසර 02කට වැඩි කාලයක සිට පැවතුණු අතර, එයින් රු.9,360,840 ක මුදලක් වසර 05 කට වැඩි කාලයක් ගතවී තිබුණි. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පතු පියවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙය නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිඵලය නොලැබීම

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) විසින් ලබා දුන් රු.5,828,147 ක ප්‍රතිපාදන යොදාගෙන මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉවත් කිරීමේ මධ්‍යස්ථාන 05ක් ප්‍රතිසංස්කරණය කර තිබුණු අතර, 2023 පෙබරවාරි 14 දිනැති NDRSC/1/2/3/12/EC/-2023 ලිපිය මගින් අදාළ ආරක්ෂක මධ්‍යස්ථාන තෝරාගැනීමේදී වැදගත් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබුණි. කෙසේ වෙතත්, ඊට පටහැනිව, ව්‍යාපෘති 05 න්, ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ඇති පාසල්වල සහන සේවා මධ්‍යස්ථාන සඳහා රු.3,828,430 ක මුළු වියදමින් වැසිකිලි ඉදිකිරීමේ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කර ඇත. | හැකි ඉක්මනින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද "ග්‍රාම ශක්ති" මාර්ගෝපදේශයට අනුව, "ග්‍රාම ශක්ති" යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇති මුදල් පරිහරණය සහ අධීක්ෂණය අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විසින් රුපියල් මිලියන 38.4 ක මුදලක් වර්ෂ 01 ක වර්ෂ 03 ක් දක්වා අතර කාලයක් අපේක්ෂිත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | හැකි ඉක්මනින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

#### 3.2.1 වැලි, පස් සහ බොරළු සඳහා බලපත්‍ර ලබා දීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1992 අංක 33 දරන හා 2009 අංක 66 දරන සංශෝධිත පතල් හා ඛනිජ පනතට අනුව වාණිජ නොවන අරමුණු සඳහා වැලි, පස් සහ බොරළු පතල් කැණීම හා ප්‍රවාහනය සඳහා එක් දින බලපත්‍රයක් නිකුත් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලබා දී තිබුණු බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පවරා තිබුණි. කෙසේ වෙතත් වාණිජ කටයුතු සඳහා මන්මුනේ නිරිතදිග ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක් දින බලපත්‍ර නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව, වාණිජ නොවන ක්‍රියාකාරකම් කුඩා ප්‍රමාණයේ අරමුණු ලෙස විස්තර කර ඇති අතර ඒවා විකුණුම් අරමුණකින් තොරව ස්වයං අවශ්‍යතා සඳහා භාවිතා කරයි. කෙසේ වෙතත්, 2022 ජනවාරි සිට 2023 අප්‍රේල් 30 දක්වා මාස 16ක කාලය තුළ වැලි කියුබ් 64ක් සහ පස් සහ බොරළු කියුබ් 508ක් කැණීම සහ ප්‍රවාහනය කිරීම සඳහා පුද්ගලයන් හතර දෙනෙකු සඳහා එක් දින බලපත්‍රයක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වැලි ගොඩදැමීමේ බලපත්‍ර සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපිත කර ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මාර්ගෝපදේශ අංක 03 අනුව, වැලි/පස්/බොරළු සඳහා ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියවිල්ල ඉදිරිපත් කළ යුතුය. නමුත් එම ලේඛන කිසිවක් නොමැතිව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එක් දින බලපත්‍ර නිකුත් කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වැලි ගොඩදැමීමේ බලපත්‍ර සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපිත කර ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාර්ගෝපදේශ අංක 04 අනුව මාසයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අවසර දී ඇති උපරිම සීමාව වැලි කියුබ් 02 ක් සහ පස් සහ බොරළු කියුබ් 35 ක් ලෙස නියම කර තිබුණි. කෙසේ වෙතත්, මාසයක් සඳහා අවසර දී ඇති උපරිම සීමාවට පටහැනිව වැලි සහ බොරළු/පාංශු බලපත්‍ර සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙළින් අවස්ථා 03කදී සහ අවස්ථා 04කදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පුනර්ජනනීය නොවන සම්පත් සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවසර දී ඇති උපරිම ප්‍රමාණය සීමා කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | මාර්ගෝපදේශ අංක 08 හා උප වගන්තිය (vii) අනුව සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතට (2009 අංක 66 පනත මගින් සංශෝධිත) අනුව, එක් දින බලපත්‍රය අවභාවිත කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. එහෙත් එම බලපත්‍ර අවභාවිත කළ බලපත්‍රලාභීන් හතර දෙනෙකුට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | බලපත්‍රලාභීන් විසින් බලපත්‍ර අයථා පරිහරණයට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | මාර්ගෝපදේශ අංක 10 අනුව, ප්‍රාදේශීය ලේකම්වරයාට ලබා දෙන බලය භාවිතා කළ හැක්කේ වාණිජ නොවන කටයුතු සඳහා පමණි. කෙසේ වෙතත්, කිසිදු පදනමක් හෝ තාර්කිකත්වයක් නොමැතිව පුද්ගලයින් හතර දෙනෙකු සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අඛණ්ඩව බලපත්‍ර නිකුත් කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වාණිජ නොවන කටයුතු සඳහා වැලි ගොඩදැමීම සඳහා පමණක් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2.2 රජයේ ඉඩම් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් නියෝග අංක 180, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ අංක 2008/04 සහ 1995 ජූනි 15 දිනැති ඉඩම් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 10 අනුව, රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම සුරක්ෂිත කිරීම ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාම නිලධාරීන්ගේ යුතුකම සහ වගකීමකි. කෙසේ වෙතත්, කන්නකිපුරම් ග්‍රාම නිලධාරී වසමේ අක්කර 04ක රජයේ ඉඩම කෝරළෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්ත ග්‍රාම නිලධාරීන් දෙදෙනෙකු විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. ඉහත | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආයතන සංග්‍රහයේ (වෙළුම II) XLVII පරිච්ඡේදය යටතේ ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීහට එරෙහිව විනය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කී ග්‍රාම නිලධාරීන් ඉහත වසමේ පසුගිය කාලයේ සේවය කර තිබුණු අතර, මෙම අල්ලා ගැනීමට එරෙහිව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වාලච්චේන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා තිබුණි. පසුව ඔවුන් දෙදෙනාම අනවසර ඉඩම්වලින් ඉවත් වී ඇත. කෙසේ වෙතත්, ආයතන සංග්‍රහයේ (වෙළුම - II) XLVII පරිච්ඡේදය ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කරන ලද වැරදිවල පළමු උපලේඛනය යටතේ රජයේ ඉඩම් සාවද්‍ය පරිහරණය කිරීම සම්බන්ධයෙන් මෙම ග්‍රාම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | වාලච්චේන, කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්නකිපුරම් ග්‍රාම නිලධාරී වසමේ මුල්ලායි නිවාස යෝජනා ක්‍රමය ආසන්නයේ පර්චස් 20ක රජයේ ඉඩමක් පුද්ගලයකු විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. අත්පත් කරන ලද රජයේ ඉඩම වැට බැඳ ඔහු සන්තකයේ පවතී. කිසිදු ලිඛිත රාජ්‍ය අධිකාරියක් නොමැතිව අත්පත් කරගත් පුද්ගලයා ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලියද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල සැපයුමද ලබාගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | 1979 අංක 7 දරණ (සංශෝධිත පරිදි) රජයේ ඉඩම් (සන්තකයේ අයකර ගැනීමේ) පනත යටතේ අත්පත් කර ගන්නා ලද ඉඩම ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹුරුමොලෙයි ග්‍රාම නිලධාරී වසමේ නිවාස යෝජනා ක්‍රමය අසල පොදු කටයුතු සඳහා වෙන්කර ඇති රජයේ ඉඩම් 50ක් ඉඩම් නියෝග අංක 83 සිට 88 දක්වා හා ඉඩම් සංවර්ධන ආඥාපනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව ඉඩම් කච්චේරියේ රඳවා තෝරා නොගත් පුද්ගලයන් 50 දෙනෙකුට පවරා තිබුණි. තවද, ඉහත රජයේ ඉඩම් නව පවරා දීම් සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ Blocking out Diagram (BOD), දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය සහ පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉඩම් කච්චේරියට කැඳවීමේ අරමුණින් එම පුද්ගලයන්ගේ ඡන්ද නාම ලේඛන හිතාමතාම කෝරළෙයි පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුම්පුරුමූලෙයි ග්‍රාම නිලධාරී කොට්ඨාශයට මාරු කර තිබුණි. ඔවුන්ගෙන් බහුතරයක් එම ඉඩම්වල පදිංචිව සිට නොතිබුණි. වෙන් කරන ලද කොටස් 50 කට වැඩි ප්‍රමාණයක් වැටක් ගසා වෙන් කර ඇති අතර ඔවුන්ට ජීවත් වීමට | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | රජයේ ඉඩම් අන්සතු කිරීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතු අතර ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රතිපාදන අනුව ඉඩම් අන්සතු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණවත් නොවන තාවකාලික පැල්පත් සකසා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) | දීර්ඝ කාලීන බදු පදනම යටතේ රජයේ ඉඩම් ඉල්ලා කෝරළෙයි පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යෝජනා ගණනාවක් ලබාගෙන තිබුණි. ඒ සඳහා 2011 සිට 2021 දක්වා රජයේ ඉඩම් බදු දීමට ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශය ලබාගෙන තිබුණි. පාසිකුඩා ප්‍රදේශයේ පිහිටි PP MADA 1179 දරන පිඹුරේ කැබලි 06 ක් තුළ (කැබලි අංක 104 හැර කැබලි අංක 101 සිට 107 දක්වා) හෝටලයක් ක්‍රියාත්මක වුවද, කැබලි අංක හතරක් (කැබලි අංක 101/105/106 සහ 107) සඳහා පමණක් මිනුම් කටයුතු කර විධිමත් පරිදි 2020 වර්ෂයේ සිට දීර්ඝ කාලීන වශයෙන් බදු දී තිබුණි. ඉතිරි කොටස් දෙක රජයේ ඉඩම් ආඥාපනත, ඉඩම් නියෝග අංක 217 සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ අංක 96/5 ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් විධිමත් කර නොතිබුණි. කැබලි අංක මග හැරීම හේතුවෙන්, එම කැබලි දෙකක (කොටස් අංක 102 සහ 103) බදු ආදායම 2020 සිට රාජ්‍ය ආදායමට අහිමි විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | රජයේ ඉඩම් ආඥාපනත, ඉඩම් නියෝග අංක 217 සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ චක්‍රලේඛ අංක 96/5 අනුව පියවර ගත යුතුය. |
| (ඉ) | 1987 අගෝස්තු 13 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අංක 4/10/13520 දරන ලිපියට අනුව මහනගර සභා සීමාව තුළ විවිධ කටයුතු සඳහා රජයේ ඉඩම් අන්සතු කිරීම සිදු කළ යුත්තේ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නොව රජයේ ඉඩම් ආඥාපනත යටතේ පමණි. කෙසේ වෙතත්, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාවලඩි ග්‍රාම නිලධාරී වසමේ රූඩ් 3 පර්චස් 15 ක ඉඩමක්, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉහත උපදෙස් උල්ලංඝනය කරමින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ 2018 වර්ෂයේදී අන්සතු කර තිබුණි. ඊට අමතරව එම අන්සතු කිරීම මහ නගර සභා සීමාව තුළ නේවාසික අවශ්‍යතා සඳහා ඉඩම්වල උපරිම කොටස ඉක්මවා ගොස් තිබුණි. | කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | 1987 අගෝස්තු 13 දිනැති අංක 4/10/13520 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව කටයුතු කළ යුතුය. |

### 3.2.3 ඉඩම් අත්පත් කර ගැනීම

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2009 වසරේ සිට ආරම්භ කර තිබූ අතර 2016 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව ලබාගෙන ඇත. . එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2017 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට (LRC) ගෙවීම සඳහා ඉහත අත්පත් කර ගැනීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමේ නිලධාරියා මුදල් ගෙවා නොතිබුණි. 2017 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එවැනි මුල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දින දක්වාත් ඉහත ඉඩම අත්පත් කර ගෙන නොතිබුණි. | කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 වර්ෂයේදී තිරායිමඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රෙද්ශයයේ ඉඩම් සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පවරාගෙන තිබුණි. 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තියට අනුව, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිරායිමඩු ග්‍රාම නිලධාරී වසමේ සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් පවරාගෙන තිබුණද, සුනාමියට ගොදුරු නොවූ රජයේ නිලධාරීන් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් කැබලි 50ක් ලබා දී තිබුණි. ඊට අමතරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA) මගින් නිවාස ඉදිකිරීම සඳහා ණය ලබා දී තිබුණි. එම අන්සතු කිරීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ අරමුණ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් උල්ලංඝනය කර ඇත. | කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තියට අනුව අදාල අරමුණ සඳහා අත්පත් කර ගත් ඉඩම් භාවිතා කළ යුතුය. |

### 3.2.4 මධ්‍යම පන්තියේ කජු වගාව සඳහා ඉඩම් පරිපාලනය (MCC)

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද එක් එක් ඉඩම් බලපත්‍ර/ඉඩම් දීමනා සඳහා ඉඩම් නියෝග අංක 125 ට අනුව ඉඩම් ලෙජරය නියමිත ආකෘතියට අනුව (LC 12) පවත්වාගෙන යා යුතුය. ඊට අමතරව ඉඩම් නියෝගය අංක 126 ට අනුව දිසාපති/ප්‍රාදේශීය ලේකම් හෝ බලයලත් නිලධාරියකු විසින් වාරික ගෙවීම් ඇතුළත් කළ යුතුය. වාලච්චේන කෝරළෙයි පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මධ්‍යම ආදායම්ලාභී පවුල් 30ක් සඳහා එක් අයකුට අක්කර 10 බැගින් ඉඩම් ලබා දී තිබුණද බලපත්‍ර 22ක් (අනුක්‍රමික අංක KP/MCC/Cash/001 සිට KP/MCC/Cash/020 දක්වා) පමණක් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. ඉඩම් ලෙජරයේ එවැනි වාර්තා නොමැති වීමෙන් ඉතිරි 8 දෙනාට බලපත්‍ර නිකුත් කර තිබේද නැද්ද යන්න විගණනයේදී තහවුරු වී නොතිබුණි. මේ නිසා එම ඉඩම්, අනවසරයෙන් අත්පත් කරගත් ඒවා නොවන බව තහවුරු කර ගැනීමට නොහැකි විය. | කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අංක 125 දරන ඉඩම් නියෝගයට අනුව කටයුතු කළ යුතුය. |

### 3.2.5 වී මිලදී ගැනීම සහ සහල් බෙදා හැරීම

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 මාර්තු 01 දිනැති අංක DFD/2023-1(II) චක්‍රලේඛයේ 2.3.7 ඡේදයට අනුව, වී බැහැර කිරීමේ වැඩසටහන සඳහා 2022/2023 මහ කන්නයේ ගොවීන්ගෙන් වී මිලදී ගත යුතුය. කෙසේ වෙතත්, ඉහත චක්‍රලේඛ විධිවිධානයට පටහැනිව කෝරළෙයි පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වී වගාවේ නිරත නොවූ පුද්ගලයින් දෙදෙනෙකුගෙන් රු.3,020,200 ක වී කිලෝග්‍රෑම් 30,202 ක් මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මෙම දිස්ත්‍රික්කයේ වී මිලදී ගැනීමේදී මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ ඉටු වී නොතිබුණි. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අංක සමාජ සවිබල ගැන්වීම් 01/2023 චක්‍රලේඛයේ 2 වැනි ඡේදයට අනුව, සහල් බෙදා හැරීම සඳහා ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අනුපිටපත් කිරීමකින් හෝ | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ |

| | | |
|---|---|---|
| ද්විත්ව ඇතුළත් කිරීමකින් තොරව සකස් කළ යුතුය. කෙසේ වෙතත්, මන්මුනෛ උතුර, මන්මුනෛ බටහිර, එරාවූර් පත්තු එරාවූර් නගරය සහ කෝරළෛයි පත්තු උතුර වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 විසින් එය කෙටි ලැයිස්තුගත කර නොතිබුණි. තවද, විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කෙටි ලැයිස්තුගත දත්තවලට අනුව, චක්‍රලේඛ විධිවිධානයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් මඟින් ප්‍රතිලාභීන් 374ක් සඳහා වටිනාකම රු.1,311,244 ක් වූ වී මිලදී ගෙන තිබුණි. | | යුතුය. |
| (ඇ) 2023 මාර්තු 01 දිනැති අංක DFD/2023-1(II) චක්‍රලේඛයට අනුව අඩු ආදායම්ලාභී පවුල්, වැඩිහිටියන් සහ රෝගීන් සඳහා සහල් සහන ලබා දීමේ අරමුණින් වී මිලදී ගැනීමේ සහ බැහැර කිරීමේ වැඩසටහන ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, ගොවීන් 40 දෙනෙකුගෙන් රු.26,007,898 ක් වටිනා වී කිලෝග්‍රෑම් 263,352 ක් මිලදී ගෙන ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක වී මිලදී ගැනීමේ සහ සහල් බෙදා හැරීමේ වැඩසටහනට වී ලබා දුන් එම ගොවි පවුල් සඳහාම සහල් කිලෝග්‍රෑම් 800 ක් බෙදා දී තිබුණි. එමෙන්ම සහල් බෙදා හැරීමේ වැඩසටහනේ අරමුණ වූයේ ඉතා අඩු ආදායම්ලාභී පවුල්වලට සහල් ලබා දීමයි. කෙසේ වෙතත්, එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක් පවුලකින් වී රු.8,636,794 ක් වටිනා වී කිලෝග්‍රෑම් 86369 ක් මිලදී ගෙන ඇති අතර, සමෘද්ධි පොරොත්තු ලේඛනය යටතේ එම පවුලටම සහල් කිලෝග්‍රෑම් 20ක් බෙදා දී තිබුණි.. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | 2023 මාර්තු 01 දිනැති අංක DFD/2023-1(II) දරන චක්‍රලේඛයේ 2.3.7 ඡේදයට අනුකූලව කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක් සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කර ඇති අතර එහි ඇස්තමේන්තුගත මුළු මුදල රු. මිලියන 392.7 කි. ව්‍යාපෘතිය අනුමත කර තිබූ අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් මුදල් වෙන්කර තිබුණි. ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ මහජන ප්‍රවේශය සඳහා වැලි පාරවල් බොරළු පාරක් බවට පත් කර මංසන්ධි ලබාදීමයි. කෙසේ වෙතත්, කිසිදු පොදු හෝ තනි පුද්ගලයෙකු පවා ප්‍රවේශය සඳහා භාවිතා නොකළ ස්ථානයක බොරළු දැමීමේ කටයුතු සිදු කර තිබුණි.. කෙසේ වෙතත්, පවුල් 30 ක් සඳහා පමණක් මංතීරු 22 ක වැඩ සිදු කර ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.27,396,192 කි. රු.6,735,000 ක ඇස්තමේන්තුගත මුදලින් මංතීරු පහක් ඉදිකර ඇති | කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවා කාර්යක්ෂමව භාවිතයට ගැනීමට සමස්ථ අවධානය යොමුකල යුතුය |

බව නිරීක්ෂණය විය.. කෙසේ වෙතත්, එහි කිසිවෙකු ජීවත් නොවූ අතර මහජන ප්‍රවේශය සඳහා සකසා ඇති මංතීරු වෙනත් මාර්ග සමඟ අන්තර් සම්බන්ධිත නොවන බවද නිරීක්ෂණය විය.

### 3.4 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 මාර්තු 31 දිනැති අංක 08/2017 චක්‍රලේඛයේ 1.6.1 වගන්තිය අනුව සහ 2021 පෙබරවාරි 18 දිනැති අංක 2021/03 චක්‍රලේඛයේ 03 ඡේදයේ (iv) උපවගන්තිය අනුව, විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සමෘද්ධිලාභී පවුල්වල සාමාජිකයින්ට මාස 06කට පසු සමෘද්ධි සහනාධාර ලබාදීම නතර කිරීමට පියවර ගත යුතු වුවද, ඉහත චක්‍රලේඛ උපදෙස් නොසලකා හරිමින් කෝරළෙයි පත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි ප්‍රතිලාභීන් 195 දෙනෙකුගේ බැංකු ගිණුමට මාසික සමෘද්ධි සහන ගෙවීම් ලෙස රු. 12,653,839 ක.මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරින්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අනුමත සංවර්ධන නිලධාරි සංඛ්‍යාව 175 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන අතිරික්ත සේවක සංඛ්‍යාව 823 කි. එබැවින් අතිරික්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 470 කි. මේ නිසා එම අතිරික්ත නිලධාරීන්ට අර්ථවත් කාර්යයක් හෝ පැවරීමක් ලබා දී ඇත්ද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. | දැනටමත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා පැවරුම් ලබාදී ඇත. | සංවර්ධන නිලධාරීන් අදාළ කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |